සැ. යු. - 2011.05.06 දින පළ වූ අංක 1705 දරන ගැසට් පත්‍රයේ III කොටස පළ නොවීය.
මෙම ගැසට් පත්‍රයේ දෙමළ අනුවාදය වෙනම මුද්‍රණය කෙරේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,706 - 2011 මැයි මස 13 වැනි සිකුරදා - 2011.05.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 918 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 919 |


සැ. යු. — ද. මු. දසනායක සමාජ සත්කාරක හා පුණ්‍යාධාර පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2011 අප්‍රේල් මස 08 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පල කරන ලදී.

නොතාරිස් (සංශෝධන) පනත් කෙටුම්පත 2011 අප්‍රේල් මස 21 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පලකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ***ගැසට් පත්‍රය*** **පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2011 මැයි මස 20 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2011 මැයි මස 06 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# පළාත් පාලන නිවේදන

## කහවත්ත ප්‍රාදේශීය සභාව

2011 වර්ෂය සඳහා වරිපනම් පැනවීම

කහවත්ත ප්‍රාදේශීය සභාව විසින් 2010 වර්ෂයේ සැප්තැම්බර් මස 28 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 5:51(II) යටතේ පහත උපලේඛනයේ දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2011 වර්ෂය සඳහා පනවන ලද ඒ වරිපනම, සෑම කාර්තුවක් තුළදී සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

2011 වර්ෂය සඳහා වන සම්පූර්ණ වරිපනම් බද්ද 2011 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ වරිපනම් බදු ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30, දෙසැම්බර් 31 යන දිනයන්ගෙන් අවසන් වන එක් එක් කාර්තුවට අදාළ වරිපනම ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%) වට්ටමක් ද ගෙවනු ලැබේ.

වජිර දර්ශන ද සිල්වා,
සභාපති,
කහවත්ත ප්‍රාදේශීය සභාව.

2011 අප්‍රේල් මස 25 වැනි දින,
කහවත්ත ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර කහවත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත්, පැරණි කහවත්ත සුළු නගර සභා බල ප්‍රදේශයට අයත්ව තිබූ ප්‍රදේශයන් ඇතුළත පිහිටි සියලුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල හා ගෙපත්වල 2009 වර්ෂයේ තක්සේරු ප්‍රතිශෝධන වාර්ෂික වටිනාකම් 2011 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාර ඉහත කී වාර්ෂික වටිනාකමින් සියයට දහයක (10%) වරිපනමක් 2011 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, සහ

ඒ වරිපනම්, එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (6) වැනි උපවගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන කාර්තු හතර තුළ දී සමාන වාරික හතරකින් ගෙවීමට විධාන කිරීමටත් කහවත්ත ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

05-228/2

---

## ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාව

වරිපනම් බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 1,134 සහ 146 වැනි උපවගන්ති යටතේ පැවරී ඇති බලතල ප්‍රකාර 2010 ඔක්තෝබර් මස 23 වැනි දින පවත්වන ලද ප්‍රාදේශීය සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කර පහත සඳහන් පරිදි 2011 වර්ෂය සඳහා වරිපනම් බදු අයකරන බව මෙයින් නිවේදනය කරමි.

ආර්. එම්. රත්නායක,
සභාපති,
ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාව.

2010 දෙසැම්බර් මස 24 වැනි දින,
ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

*01 වැනි යෝජනාව*

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාව විසින් දියුණු කළ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද සෑම ප්‍රදේශයකම පිහිටි සෑම නිශ්චල දේපළක වටිනාකම, 2005 වර්ෂයේ දී තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු කරන ලද වටිනාකම අනුව 2011 වර්ෂයේ වාර්ෂික වටිනාකම ලෙස පිළිගත යුතු යැයි යෝජනා කරමි.

*02 වැනි යෝජනාව*

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් හා (6) වැනි උපවගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාව විසින් දියුණු කළ ප්‍රදේශය ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශයේ පිහිටි සෑම නිශ්චල දේපළක වාර්ෂික වටිනාකමෙන් 10%ක අනුප්‍රමාණය අනුව වූ වරිපනමක් 2011 වර්ෂය සඳහා පනවා අය කර ගත යුතු යැයි ද වාර්ෂික වරිපනම් මුදල 2011 මාර්තු 31, ජුනි 30 හා සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලට පෙර සමාන වාරික 04කින් ගෙවීමට විධාන කළ යුතු යැයි ද යෝජනා කරමි.

05-325/8

---

## කාරතීවු ප්‍රාදේශීය සභාව

වරිපනම් බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය යටතේ කාරතීවු ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පහත සඳහන් ග්‍රාම නිලධාරි වසම තුළ පිහිටා ඇති සියලුම දේපළවල වාර්ෂික වටිනාකමින් 8% බැගින් වූ වරිපනම් බද්දක් 2011.01.01 දින සිට අයකිරීමට කාරතීවු ප්‍රාදේශීය සභාව 2010.07.30 වැනි දින තීරණය කර ඇති බව මෙයින් ප්‍රකාශයට පත්කරනු ලැබේ.

*ග්‍රාම නිලධාරි වසම :*

කාරතීවු 01,02,03,04,05,06,07,08,10,11 සහ 12

මාලිකයිකාඩු නැගෙනහිර, මාලිකයිකාඩු මධ්‍යම සහ මාලිකයිකාඩු බටහිර මාවඩිපල්ලි නැගෙනහිර සහ බටහිර

එන්. ජීවරාසා,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
කාරතීවු.

2010 අගෝස්තු මස 20 වැනි දින,

05-323

# විවිධ දැන්වීම්

## කහවත්ත ප්‍රාදේශීය සභාව

### කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාමට අදාළ අතුරු ව්‍යවස්ථා යටතේ 2011 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර මත ගාස්තු පැනවීම

කහවත්ත ප්‍රාදේශීය සභාව විසින් 2010 වර්ෂයේ සැප්තැම්බර් මස 28 දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 5:51(VI) යටතේ පහත උපලේඛනයේ දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව, කිසියම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ කහවත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාම සඳහා 2011 වර්ෂයේ දී කහවත්ත ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් මතම ගාස්තුවක් අයකරනු ලබන බව වැඩි දුරටත් නිවේදනය කරනු ලැබේ.

වජිර දර්ශන ද සිල්වා,
සභාපති,
කහවත්ත ප්‍රාදේශීය සභාව.

2011 අප්‍රේල් මස 25 වැනි දින,
කහවත්ත ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථාවක් යටතේ හෝ කහවත්ත ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවක් යටතේ කහවත්ත ප්‍රාදේශීය සභාව විසින් 2011 වර්ෂය තුළ දී නිකුත් කරනු ලබන බලපත්‍ර සම්බන්ධයෙන්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමඟ කියවිය යුතු 149 වැනි වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන්, එම උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් පනවා අයකිරීමට කහවත්ත ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

***උපලේඛනය***

| *I වැනි තීරුව* | | *II වැනි තීරුව* | | |
|---|---|---|---|---|
| *අනු. අංකය* | *කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය* | *ස්ථානයේ වාර්ෂික වටිනාකම* | | |
| | | *රු.750 නොඉක්මවන අවස්ථාවක* | *රු.750 ඉක්මවන එහෙත් රු. 1500 නොඉක්මවන අවස්ථාවක* | *රු.1500 ඉක්මවන අවස්ථාවක* |
| | | *රු. ශ.* | *රු. ශ.* | *රු. ශ.* |
| 01 | නවාතැන් ගන්නා ස්ථානයක්/තානායමක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 02 | හෝටලයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 1,000 0 |
| 03 | භෝජනාගාරයක්/බත් කඩයක් පවත්වාගෙන යාම | 400 0 | 550 0 | 850 0 |
| 04 | ආපනශාලාවක් පවත්වාගෙන යාම | 400 0 | 550 0 | 800 0 |
| 05 | තේ හෝ කෝපි කඩයක් පවත්වාගෙන යාම | 400 0 | 500 0 | 750 0 |
| 06 | එළකිරි එකතුකිරීමේ හෝ වෙළඳාම් ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 07 | බේකරියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 08 | කිරි පට්ටියක් පවත්වාගෙන යාම | 350 0 | 550 0 | 800 0 |
| 09 | මාළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 10 | මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 11 | අයිස් ක්‍රීම්/අයිස් පැකට්/යෝගට් නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 12 | සිසිල් බීම නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම | 450 0 | 700 0 | 1,000 0 |
| 13 | ලොන්ඩරියක් පවත්වාගෙන යාම | 450 0 | 750 0 | 1,000 0 |
| 14 | ගව ගාලක් පවත්වාගෙන යාම | 350 0 | 550 0 | 800 0 |
| 15 | මස් පිණිස සත්ව ඝාතන මඩුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 16 | බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 17 | තාවකාලික බලපත්‍ර | 500 0 | 750 0 | 1,000 0 |
| 18. | වී මෝලක්/ඇඹරුම්හලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 19 | වාහන සේවා ස්ථානයක් පවත්වාගනෙ යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 20 | ගල් වැඩපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

05-228/6

## කහවත්ත ප්‍රාදේශීය සභාව

2011 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීම

කහවත්ත ප්‍රාදේශීය සභාව විසින් 2010 වර්ෂයේ සැප්තැම්බර් මස 28 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 5:51(V) යටතේ පහත උපලේඛනයේ දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2011 වර්ෂය සඳහා පනවන ලද ඒ කර්මාන්ත බද්ද, ඒ වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

වජිර දර්ශන ද සිල්වා,<br>
සභාපති,<br>
කහවත්ත ප්‍රාදේශීය සභාව.

2011 අප්‍රේල් මස 25 වැනි දින,<br>
කහවත්ත ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

*යෝජනාව*

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (I) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර කහවත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන්, එම උපලේඛනයේ II වැනි තීරුවේ, ඒ එක් එක් කර්මාන්තය පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුරූප තීරුවේ, නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2011 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවටත්, එකී කර්මාන්ත බද්දට යටත් තැනැත්තෙකු 2011 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර කහවත්ත ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් කහවත්ත ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

*උපලේඛනය*

| | *I වැනි තීරුව* | *II වැනි තීරුව* | | |
|---|---|---|---|---|
| *අනු. අංකය* | *කර්මාන්ත බදු* | *ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල්* | | |
| | | *රු. 750 නොඉක්මවන අවස්ථාවක* | *රු. 750 ඉක්මවන එහෙත් රු. 1500 නොඉක්මවන අවස්ථාවක* | *රු. 1500 ඉක්මවන අවස්ථාවක* |
| | | *රු. ශ.* | *රු. ශ.* | *රු. ශ.* |
| 01 | රෙදි පිළි හා නිමි ඇඳුම් විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 02 | සිමෙන්ති භාණ්ඩ නිෂ්පාදනය | 450 0 | 600 0 | 1,000 0 |
| 03 | වඩු කර්මාන්තය | 450 0 | 600 0 | 1,000 0 |
| 04 | ගෘහ භාණ්ඩ නිෂ්පාදනය | 450 0 | 600 0 | 1,000 0 |
| 05 | ගෘහ භාණ්ඩ නිපදවීම/විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 06 | ස්වර්ණාභරණ නිපදවීම හෝ විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 07 | වාස්තු කර්මාන්තය | 450 0 | 600 0 | 1,000 0 |
| 08 | තීන්ත වර්ග විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 09 | වැල්ඩින් කිරීම | 450 0 | 600 0 | 1,000 0 |
| 10 | හුණු පිලිස්සීම | 500 0 | 750 0 | 1,000 0 |
| 11 | ගොඩනැගිලි ද්‍රව්‍ය විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 12 | රසකැවිලි නිපදවීම/අලෙවිය | 350 0 | 550 0 | 1,000 0 |
| 13 | ශීතකළ මස්-මාළු විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 14 | සත්ත්ව ආහාර නිපදවීම | 350 0 | 550 0 | 1,000 0 |
| 15 | විදුලි උපකරණ විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 16 | පොත්පත් ලිපි ද්‍රව්‍ය විකිණීම | 450 0 | 700 0 | 1,000 0 |
| 17 | බටහිර ඖෂධ විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 18 | ආයුර්වේද බෙහෙත් ද්‍රව්‍ය විකිණීම | 350 0 | 550 0 | 1,000 0 |
| 19 | දත් බඳින ස්ථානයක් පවත්වාගෙන යාම | 450 0 | 650 0 | 900 0 |
| 20 | ඇස් කන්නාඩි විකිණීම | 450 0 | 700 0 | 1,000 0 |
| 21 | කැසට් පට හා සංයුක්ත තැටි විකිණීම/කුලියට දීම | 500 0 | 750 0 | 1,000 0 |
| 22 | ගඩොල් හෝ උළු, නිපදවීම හෝ විකිණීම | 350 0 | 550 0 | 1,000 0 |
| 23 | විසිතුරු භාණ්ඩ නිපදවීම හා විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 24 | කුළු බඩු/කසාය බඩු/බෙහෙත් ද්‍රව්‍ය පැකට් කිරීම | 350 0 | 550 0 | 800 0 |
| 25 | පළතුරු විකිණීම | 350 0 | 650 0 | 1,000 0 |
| 26 | ආහාර ද්‍රව්‍ය හා කුළු බඩු අලෙවි කිරීම | 400 0 | 700 0 | 1,000 0 |
| 27 | ග්‍රොසරියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 28 | කොන්ඩා සැකසීමේ ස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 29 | සිල්ලර වෙළඳාම | 450 0 | 750 0 | 1,000 0 |
| 30 | බුලත්-දුම්කොළ වෙළඳාම | 350 0 | 550 0 | 800 0 |
| 31 | බුලත් විට වෙළඳාම | 350 0 | 550 0 | 800 0 |
| 32 | කෘත්‍රිම පොහොර අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 33. | රථ වාහන අමතර කොටස් අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 34. | පිංතූර රාමු කිරීම | 450 0 | 650 0 | 1,000 0 |

| *I වැනි තීරුව* | | *II වැනි තීරුව* | | |
|---|---|---|---|---|
| *අනු අංකය* | *කර්මාන්ත බදු* | *ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල්* | | |
| | | *රු. 750 නොඉක්මවන අවස්ථාවක* | *රු. 750 ඉක්මවන එහෙත් 1,500 නොඉක්මවන අවස්ථාවක* | *රු. 1,500 ඉක්මවන අවස්ථාවක* |
| 35. | මෝටර් සයිකල් අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 36. | පාපැදි විකිණීම | 450 0 | 650 0 | 1,000 0 |
| 37. | සාප්පු බඩු විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 38. | පැණි, හකුරු නිපදවීම හා විකිණීම | 350 0 | 650 0 | 850 0 |
| 39. | අයිස් ක්‍රීම්/අයිස් පැකට්/යෝගට් විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 40. | සත්ව ආහාර අලෙවි කිරීම | 350 0 | 550 0 | 850 0 |
| 41. | තොග ගබඩා හා අලෙවි කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 42. | පාවහන් අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 43. | පාවහන් අළුත්වැඩියාව හා නිෂ්පාදනය | 350 0 | 600 0 | 900 0 |
| 44. | සුළු අපනයන භෝග මිලට ගැනීම හා විකිණීම | 450 0 | 600 0 | 1,000 0 |
| 45. | මැණික් වෙළඳාම | 500 0 | 750 0 | 1,000 0 |
| 46. | රබර් මිලට ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 47. | මැණික් කැපීම හා ඔප දැමීම | 500 0 | 750 0 | 1,000 0 |
| 48. | සිගරට් තොග වෙළඳාම | 500 0 | 750 0 | 1,000 0 |
| 49. | රා එකතු කිරීමේ ස්ථානයක් සඳහා | 450 0 | 650 0 | 900 0 |
| 50. | මෙරට සහ රට බීම අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 51. | පොල් ගබඩා කිරීම හා අලෙවිය | 350 0 | 550 0 | 850 0 |
| 52. | කුරුඳු මිලට ගන්නා ස්ථානයක් සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 53. | කෘෂි රසායන ද්‍රව්‍ය ගබඩා කිරීම හා අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 54. | මැටි භාණ්ඩ නිපදවීම හා අලෙවිය | 350 0 | 550 0 | 800 0 |
| 55. | කූල් ස්පොට් එකක් පවත්වාගෙන යාම | 450 0 | 550 0 | 900 0 |
| 56. | සුරතල් මාළු/සතුන්/මල් පැල අලෙවි කිරීම | 350 0 | 600 0 | 850 0 |
| 57. | වන වගා පැල තවාන් පවත්වාගෙන යාම | 350 0 | 500 0 | 950 0 |
| 58. | තේ කොළ අලෙවිය | 350 0 | 550 0 | 900 0 |
| 59. | ප්ලාස්ටික්/ඇලුමිනියම් භාණ්ඩ අලෙවිය | 450 0 | 650 0 | 1,000 0 |
| 60. | කෘත්‍රිම මල් නිෂ්පාදනය හා අලෙවිය | 450 0 | 650 0 | 1,000 0 |
| 61. | තැඹිලි/කුරුම්බා අලෙවිය | 350 0 | 500 0 | 750 0 |
| 62. | රූපවාහිනී ඇන්ටනා නිෂ්පාදනය හා අලෙවිය | 350 0 | 550 0 | 800 0 |
| 63. | දේපළ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 64. | ලැමිනේටිං/ෆොටෝ ග්‍රැපික් ස්ථානයකට | 500 0 | 750 0 | 1,000 0 |
| 65. | ශබ්දවාහිනී කුලියට දීම | 500 0 | 750 0 | 1,000 0 |
| 66. | ලොතරැයි අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 67. | සංචාරක වෙළඳාම | 450 0 | - | - |
| 68. | පෞද්ගලික සතිපොලක් පවත්වාගෙන යාම | - | 750 0 | 1,000 0 |
| 69. | ධාන්‍ය, ඇට වර්ග පැකට් කිරීම | 350 0 | 600 0 | 800 0 |
| 70. | ගල් ස්මාරක හෝ ගලින් කරන ලද භාණ්ඩ අලෙවිය | 350 0 | 500 0 | 800 0 |
| 71. | තේ පෙට්ටි හෝ ලෑලි පෙට්ටි නිෂ්පාදනය | 400 0 | 550 0 | 850 0 |
| 72. | තේ පැල තවානක් සඳහා | - | 750 0 | 1,000 0 |
| 73. | ලියුම් කවර හෝ වෙනත් කවර නිෂ්පාදනය | 350 0 | 550 0 | 850 0 |
| 74. | නූඩ්ලස්/ඉඳිආප්ප/ක්ෂණික ආහාර නිපදවීම | 450 0 | 600 0 | 1,000 0 |
| 75. | යන්ත්‍රානුසාරයෙන් පොල්තෙල් නිපදවීම | 450 0 | 550 0 | 800 0 |
| 76. | බ්ලොක් ගල් නිපදවීම හා විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 77. | හුණු පෝරණුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 78. | සියලුම ගෘහ විදුලි උපකරණ අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 79. | ටයර්, ටියුබ් විකිණීම හෝ අළුත්වැඩියාව | 400 0 | 600 0 | 1,000 0 |
| 80. | ලෝහ තහඩු වලින් භාණ්ඩ නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 81. | මෙට්ට නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 82. | ඉන්ධන පිරවුම්හලක් සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 83. | හඳුන්කූරු නිෂ්පාදනය | 450 0 | 650 0 | 1,000 0 |
| 84. | ග්‍රිල් වැඩපලක් සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 85. | සිමෙන්ති භාණ්ඩ නිපදවීම/විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 86. | පිත්තල භාණ්ඩ නිපදවීම හෝ අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 87. | දුරකථන හා දුරකථන උපකරණ වෙළඳාම | 500 0 | 750 0 | 1,000 0 |
| 88. | බෑග් වර්ග මැසීම හා විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 89. | විදුලි උපකරණ අළුත්වැඩියාව | 500 0 | 750 0 | 1,000 0 |
| 90. | එළවළු වෙළඳාම | 450 0 | 650 0 | 1,000 0 |

| අනු අංකය | I වැනි තීරුව කර්මාන්ත බදු | II වැනි තීරුව ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල් රු. 750 නොඉක්මවන අවස්ථාවක | රු. 750 ඉක්මවන එහෙත් 1,500 නොඉක්මවන අවස්ථාවක | රු. 1,500 ඉක්මවන අවස්ථාවක |
|---|---|---|---|---|
| 91. | කුසින් වැඩ (කුෂන්) කරන ස්ථාන | 500 0 | 750 0 | 1,000 0 |
| 92. | ඔරලෝසු අළුත්වැඩියාව | 450 0 | 650 0 | 1,000 0 |
| 93. | ගෝනි අලෙවි කරන ස්ථාන | 450 0 | 650 0 | 1,000 0 |
| 94. | පරිගණක අලෙවිය හා අළුත්වැඩියාව | 500 0 | 750 0 | 1,000 0 |
| 95. | අවමංගල්‍ය භාණ්ඩ අලෙවිය හා කුලියට දීම | 500 0 | 750 0 | 1,000 0 |
| 96. | අටපිරිකර හා පූජා භාණ්ඩ අලෙවිය | 450 0 | 650 0 | 1,000 0 |
| 97. | ලියවන පට්ටල් වැඩපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 98. | ලී වෙළඳ සැලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 99. | පැරණි යකඩ බඩු මිලට ගැනීම හා විකිණීම | 450 0 | 650 0 | 1,000 0 |
| 100. | බැටරි චාර්ජ් කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 101. | රන් රිදී ආලේප කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 102. | ගෑස් ගබඩා කිරීම හා අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |

05-228/5

---

**කහවත්ත ප්‍රාදේශීය සභාව**

2011 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

කහවත්ත ප්‍රාදේශීය සභාව විසින් 2010 වර්ෂයේ සැප්තැම්බර් මස 28 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 5:51(IV) යටතේ පහත උපලේඛනයේ දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව කහවත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මේ බද්දට යටත් වන කිසියම් වාහනයක් හෝ සතෙකු තබා ගන්නා සෑම තැනැත්තෙකු විසින් , එකී වාහනය හෝ සතා තමන් භාරයේ තබා ගන්නා දින ගණන දින තිහක් සම්පූර්ණ වූ වහාම 2011 වර්ෂය සඳහා වන මෙම බද්ද කහවත්ත ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

වජිර දර්ශන ද සිල්වා,
සභාපති,
කහවත්ත ප්‍රාදේශීය සභාව.

2011 අප්‍රේල් මස 25 වැනි දින,
කහවත්ත ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වැනි වගන්තිය සහ හතරවැනි උපලේඛනයේ විධිවිධානවලින් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර කහවත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2011 වර්ෂයේ දී පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තෙකු මත ම, එහි II වැනි තීරුවේ අනුරූපිත සටහනෙහි නිරූපිත බද්දක් 2011 වර්ෂය සඳහා පනවා අය කිරීමට කහවත්ත ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

***උපලේඛනය***

| | | I වැනි තීරුව | II වැනි තීරුව රු. ශ. |
|---|---|---|---|
| (1) | (i) | මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක්, හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා | 25 0 |
| | (ii) | සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ බයිසිකල් කරත්තයක් සඳහා - | |
| | | *(අ)* වෙළඳ කාර්යයන් සඳහා යොදවන්නේ නම් | 18 0 |
| | | *(ආ)* වෙළඳ නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම් | 4 0 |
| | (iii) | සෑම කරත්තයක් සඳහා | 20 0 |
| | (iv) | සෑම අත් කරත්තයක් සඳහා | 10 0 |
| | (v) | සෑම රික්ෂෝවක් සඳහා | 7 5 |
| | (vi) | සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහා | 15 0 |
| | (vii) | සෑම ඇතෙකු සඳහා | 50 0 |

(2) විෂ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන, වීල් බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළඳ කාර්ය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළඳ කාර්ය සඳහා නොයොදවන අත් කරත්ත ඉහත ගෙවීමෙන් නිදහස් කෙරේ.

05-228/4

**කහවත්ත ප්‍රාදේශීය සභාව**

2011 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද පැනවීම

කහවත්ත ප්‍රාදේශීය සභාව විසින් 2010 වර්ෂයේ සැප්තැම්බර් මස 28 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 5:51(III) යටතේ පහත උපලේඛනයේ දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2011 වර්ෂය සඳහා පනවන ලද ඒ ව්‍යාපාර බද්ද, ඒ වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

වජිර දර්ශන ද සිල්වා,
සභාපති,
කහවත්ත ප්‍රාදේශීය සභාව.

2011 අප්‍රේල් මස 25 වැනි දින,
කහවත්ත ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එකී පනතේ 150 වැනි වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ හා වෘත්තියක් නොවන්නා වූ කිසියම් ව්‍යාපාරයක් කහවත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2011 වර්ෂයේ දී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන් ම, එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛනයේ I වැනි තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක එහි II වැනි තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් 2011 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, බද්දට යටත් යම් තැනැත්තෙකුම එකී ව්‍යාපාර බද්ද 2011 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර කහවත්ත ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් කහවත්ත ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

*උපලේඛනය*

| | *I වැනි තීරුව* | *II වැනි තීරුව* |
|---|---|---|
| | *බද්ද අදාළ වන වර්ෂයට පෙර වර්ෂයේ ව්‍යාපාරයේ ලත් ලැබීම් ප්‍රමාණය* | *ගෙවිය යුතු බද්ද රු. ශ.* |
| 1. | රු. 6,000 නොඉක්මවන අවස්ථාවක | නැත |
| 2. | රු. 6,000 ඉක්මවන නමුත් 12,000 නොඉක්මවන විට | 90 0 |
| 3. | රු. 12,000 ඉක්මවන නමුත් 18,750 නොඉක්මවන විට | 180 0 |
| 4. | රු. 18,750 ඉක්මවන නමුත් 75,000 නොඉක්මවන විට | 360 0 |
| 5. | රු. 75,000 ඉක්මවන නමුත් 1,50,000 නොඉක්මවන විට | 1,200 0 |
| 6. | රු. 1,50,000 ඉක්මවන විට | 3,000 0 |

05-228/3

---

**කහවත්ත ප්‍රාදේශීය සභාව**

2011 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම

කහවත්ත ප්‍රාදේශීය සභාව විසින් 2010 වර්ෂයේ සැප්තැම්බර් මස 28 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 5:51(I) යටතේ පහත උපලේඛනයේ දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2011 වර්ෂය සඳහා පනවන ලද ඒ අක්කර බද්ද, සෑම කාර්තුවක් තුළ දී සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

2011 වර්ෂය සඳහා වන සම්පූර්ණ අක්කර බද්ද 2011 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ අක්කර බදු ප්‍රමාණයෙන් සියයට දහය (10%) ක වට්ටමක් ද, මාර්තු 31 - ජූනි 30 - සැප්තැම්බර් 30 - දෙසැම්බර් 31 යන

දිනයන්ගෙන් අවසන් වන එක් එක් කාර්තුවට අදාළ අක්කර බද්ද ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහ (5%) ක වට්ටමක් ද ගෙවනු ලැබේ.

වජිර දර්ශන ද සිල්වා,
සභාපති,
කහවත්ත ප්‍රාදේශීය සභාව.

2011 අප්‍රේල් මස 25 වැනි දින,
කහවත්ත ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

*යෝජනාව*

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර කහවත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූ ඉහත කී පනතේ 135 වැනි වගන්තියේ නියමය යටතේ අක්කර බද්දෙන් නිදහස් කර නොමැත්තාවූ ද, ස්ථිර හෝ නිතිපතා ගොවිතැනක් යටතේ වූ,

*(අ)* හෙක්ටයාර් පහක් හෝ ඊට වැඩි වූ සෑම ඉඩමක් වෙනුවෙන් ම, එකී ඉඩමේ සෑම හෙක්ටයාරයක් ම මත 2011 වර්ෂය සඳහා රුපියල් 10 0 බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමටත්,

*(ආ)* ඉහත කී පනතේ 134 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියේ අතුරු විධානය යටතේ පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යතුමා විසින් කහවත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය විශේෂ ප්‍රදේශයක් වශයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ (ආ) වැනි කොටසේ 1989.02.03 වැනි දිනැති *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කර ඇති හෙයින්, හෙක්ටයාර් එකකට වැඩි එහෙත් හෙක්ටයාර් පහකට අඩු සෑම ඉඩමක් මත, 2011 වර්ෂය සඳහා රුපියල් 10 0 බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමට ; සහ

*(ඇ)* ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (6) වැනි උපවගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලට පෙර සමාන වාරික හතරකින් ගෙවීමට විධාන කළ යුතු යයි ද කහවත්ත ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

05-228/1

---

**ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාව**

ප්‍රචාරක දැන්වීම් දෘෂ්‍ය පරිසරය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 122(1) වගන්තියෙන් මට පැවරී ඇති බලතල අනුව, 1988.08.23 වැනි දින අංක 520/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ IV(ආ) කොටසේ පළාත් පාලන අති විශෙෂ *ගැසට් පත්‍රයේ* පළකර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ 39 වැනි කොටසේ ප්‍රචාරක/දෘෂ්‍ය පරිසර විධිවිධාන ප්‍රකාර ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභා සීමාව තුළ යම් ක්‍රමයකට පාරකට, ඇලකට, වැවකට හෝ අහසට පෙනෙන පරිදි දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් බලපත්‍ර ගාස්තුවක් 2011 වර්ෂයේ සිට අය කිරීමට සභාව තීරණය කර ඇති බව ප්‍රකාශයට පත් කරමි.

ආර්. එම්. රත්නායක,
සභාපති,
ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාව.

2010 දෙසැම්බර් මස 24 වැනි දින,
ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතෙන් ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2010 දෙසැම්බර් මස 23 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී පහත සඳහන් උපලේඛනයට අනුව 2011 වර්ෂය සඳහා අයකළ යුතු යැයි යෝජනා කරමි.

*උපලේඛනය*

| | | රු. ශත |
|---|---|---|
| 01. | විදුලි බුබුළු, වෙනත් විද්‍යුත් උපකරණ යොදා දැන්වීම් පුවරුවක් වෙනුවෙන් වර්ග අඩියකට | 25 0 |
| 02. | ස්ථිර දැන්වීම් පුවරුවක් සඳහා වර්ග අඩියකට | 25 0 |
| 03. | ඉඩම් වෙන්දේසි කිරීම සම්බන්ධ දැන්වීම් පුවරුවක් වෙනුවෙන් වර්ග අඩියකට | 25 0 |
| 04. | ඉඩම් වෙන්දේසි කිරීමේ රෙදි බැනරයක් සඳහා වර්ග අඩියකට | 10 0 |
| 05. | වෙනත් සාමාන්‍ය රෙදි බැනරයක් සඳහා වර්ග අඩියකට | 10 0 |
| 06. | කිසියම් බැම්මක, බිත්තියක ප්‍රදර්ශන දැන්වීමක් වසරකට වර්ග අඩියකට | 25 0 |
| 07. | ලී රාමුවක සවි කළ කණුවක හෝ ගල්වල ප්‍රදර්ශනය කරන කුඩා වර්ගයේ දැන්වීම් පුවරු සඳහා වර්ග අඩියකට | 1 0 |
| 08. | කිසියම් වීථියකට හෝ පාරකට මුහුණලා පිහිටි ගොඩනැගිල්ලේ මුහුණතෙහි සීමාව ඉක්මවා යන දිගින් යුතු ප්‍රචාරක දැන්වීමක් සවි කිරීම, එල්ලා තැබීම හෝ පින්තාරු කිරීම වෙනුවෙන් වර්ග අඩියකට | 25 0 |

05-325/2

## ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාව

ව්‍යාපාර බද්දක් පැනවීම - 2011 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 152 වැනි වගන්තිය යටතේ ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර, 2010 දෙසැම්බර් මස 23 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ආර්. එම්. රත්නායක,
සභාපති,
ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාව.

2010 දෙසැම්බර් මස 24 වැනි දින,
ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනතෙන් හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ 150 වැනි වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ යම් ව්‍යාපාරයක් ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත 2011 වර්ෂයේ දී පවත්වාගෙන යන සෑම තැනැත්තෙකුගෙන් එම ව්‍යාපාරයේ 2011 වර්ෂයේ ආදායම මෙහි උපලේඛනයේ 01 වැනි තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක එහි 02 වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනු ප්‍රමාණය අනුව බද්දක් 2011 වර්ෂය සඳහා පනවා අය කළ යුතු යැයි ද, එකී බලපත්‍ර ගාස්තු 2011 මාර්තු 31 වැනි දිනට ප්‍රථම මෙම සභාවට ගෙවිය යුතු බවත් මෙයින් යෝජනා කරමි.

*උපලේඛනය*

| *1 වැනි තීරය* | *11 වැනි තීරය* *රු. ශ.* |
|---|---|
| රු. 6,000 නොඉක්මවන අවස්ථාවක | කිසිවක් නැත |
| රු. 6001 සිට රු. 12,000 දක්වා | 90 0 |
| රු. 12,001 සිට රු. 18,750 දක්වා | 180 0 |
| රු. 18,751 සිට රු. 75,000 දක්වා | 300 0 |
| රු. 75,001 සිට රු. 1,50,000 දක්වා | 1,200 0 |
| රු. 1,50,000 ට වැඩි | 3,000 0 |

මෙම ව්‍යාපාර බදු අදාළ වන ව්‍යාපාර පහත දැක්වේ :-

01. කොමිස් ඒජන්තවරු
02. වෙන්දේසිකරුවන්
03. බ්‍රෝකර්වරු
04. මුදල් ආයෝජකයන්
05. මුදල් ණයට දෙන්නන්
06. කොන්ත්‍රාත්කරුවන්
07. උකස් බඩු ගන්නන්
08. පුද්ගලික පන්ති පවත්වන්නන්
09. ගණන් පරීක්ෂකවරු
10. ගෘහ නිර්මාණ ශිල්පීන්
11. දේශීය හා විදේශීය දුරකථන මධ්‍යස්ථාන පවත්වන්නන්
12. ලොතරැයි අලෙවි නියෝජිතයන්
13. රක්ෂණ ව්‍යාපාර
14. දේශීය හා විදේශීය බැංකු ආයතන
15. රැකියා ඒජන්සි පවත්වන්නන්
16. රේස් ඔට්ටු දැමීමේ ව්‍යාපාර
17. රියැදුරු රථ අයිතිකරුවන්
19. පින්තාරුකරුවන්
20. සතුන් වෙළඳාම්කරන්නන්
21. පුද්ගලික තැපැල් ස්ථාන
22. සැපයුම්කරුවන්

සටහන :- තක්සේරු නොකරන ලද ව්‍යාපාරයන්හි වාර්ෂික වටිනාකම රු. 750ක් සේ සලකා බලපත්‍ර ගාස්තු අයකරනු ලැබේ.

මෙම බලපත්‍ර ගාස්තු 2011 මාර්තු 31 වැනි දිනට ප්‍රථම මෙම සභාවට ගෙවිය යුතු බවත්, මෙයින් පසු ලබාගන්නා බලපත්‍ර සඳහා 10%ක දඩ මුදලක් අයකරන බව ද දැනුම් දෙමි.

05-325/3

---

## ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාව

විනෝද බදු ආඥාපනත යටතේ බදු අය කිරීම - 2011

2011 වර්ෂය සඳහා විනෝද බදු ආඥා පනත යටතේ මුදල් අයකර පෙන්වන සෑම චිත්‍රපට දර්ශනයක්, ආධාර චිත්‍රපට දර්ශනයක්, සර්කස් සංදර්ශනයක් සඳහා නිකුත් කරනු ලබන ප්‍රවේශ පත්‍රවල වටිනාකමින් 10%ක විනෝද බද්දක් ගෙවිය යුතු වන්නේය. මීට අමතරව ඉහත සංදර්ශන වෙනුවෙන් පහත සඳහන් ආකාරයට බලපත්‍ර ගාස්තුවක් ගෙවිය යුතුය.

ආර්. එම්. රත්නායක,
සභාපති,
ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාව.

2010 දෙසැම්බර් මස 24 වැනි දින,
ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| | | *රු. ශත* |
|---|---|---|
| 01. | එක් දිනක් සඳහා තාවකාලික චිත්‍රපට දර්ශන, සර්කස් සංදර්ශන, හෝ වෙනයම් වර්ගයක සංදර්ශනයක් සඳහා | 500 0 |
| 02. | ඊට වැඩිවන සෑම දිනක් සඳහාම | 250 0 |
| 03. | සංගීත සංදර්ශනයක් සඳහා එක් දිනක් වෙනුවෙන් | 5,000 0 |

05-325/4

---

## ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාව

වීරී රේඛා, ගොඩනැගිලි, පුස්තකාල සහ වෙනත් ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් පැවරී ඇති බලතල ප්‍රකාරව නිකුත් කරන සහතිකයන් හා සභාවට අයත් වත්කම් කුලියට දීම සඳහා මෙහි පහත සඳහන් ප්‍රකාර ගාස්තු 2011 වර්ෂය තුළ දී පනවා අය කරනු ලබන බව නිවේදනය කරනු ලැබේ.

ආර්. එම්. රත්නායක,
සභාපති,
ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාව.

2010 දෙසැම්බර් මස 24 වැනි දින,
ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතෙන් ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2010 දෙසැම්බර් මස 23 වැනි දින

පවත්වන ලද සභා රැස්වීමේ දී පහත සඳහන් උපලේඛනයට අනුව 2011 වර්ෂය සඳහා අය කළ යුතු යැයි යෝජනා කරමි.

*උපලේඛනය*

| | | රු. ශත |
|---|---|---|
| 1. | පුස්තකාල සාමාජික ගාස්තු | 25 0 |
| 2. | පුස්තකාල තැන්පත් මුදල් | 50 0 |
| 3. | පුස්තකාල ප්‍රමාද ගාස්තු (දිනකට) | 1 0 |
| 4. | වීථි රේඛා සහතිකයක් සඳහා | 500 0 |
| 5. | වීථි රේඛා පරීක්ෂණ ගාස්තු සඳහා | 300 0 |
| 6. | ගොඩනැගිලි අනුමත කිරීමේ ගාස්තු (වර්ග අඩියකට) | 1 25 |
| 7. | ගොඩනැගිලි පරීක්ෂණ ගාස්තු සඳහා | 500 0 |
| 8. | දීර්ඝකාලීන බදු බලපත්‍ර සඳහා නිර්දේශ ලබාදීම | 500 0 |
| 9. | දීර්ඝකාලීන බදු බලපත්‍ර සඳහා නිර්දේශ ලබාදීමේ පරීක්ෂණ ගාස්තු | 300 0 |

05-325/5

---

## ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාව

වාහන හා සත්ව බද්ද පැනවීම - 2011 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 148 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 147 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර, 2010 වර්ෂයේ දෙසැම්බර් මස 23 වැනි දින පවත්වන ලද ප්‍රාදේශීය සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ආර්. එම්. රත්නායක,
සභාපති,
ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාව.

2010 දෙසැම්බර් මස 24 වැනි දින,
ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව :-

**වාහන හා සත්ත්ව බද්ද**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතෙන් 148 වැනි වගන්තිය සමග කියවිය යුතු ඒ පනතේ 147 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර සාමාන්‍යයෙන් ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ ඇති හෝ පාවිච්චි කරනු ලබන්නා වූ සෑම වාහනයක් සහ සතෙක් වෙනුවෙන් ම මෙහි උපලේඛනයේ සඳහන් අනුප්‍රමාණ අනුව වූ වාර්ෂික බද්දක් 2011 වර්ෂයේ දී පනවා අය කළ යුතු යැයි යෝජනා කරමි.

*උපලේඛනය*

| | | රු. ශ. |
|---|---|---|
| 01. | මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, කරත්තයක්, ජින් රික්ෂෝවක්, මෝටර් බයිසිකලයක්, ට්‍රයිකාරයක් හෝ බයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා | 25 0 |
| 02. | සෑම බයිසිකලයක් හෝ සෑම කරත්තයක් සඳහාම- | |
| | *(අ)* වෙළඳ කාර්යයන් සඳහා යොදවන්නේ නම් | 18 0 |
| | *(ආ)* වෙළඳ කාර්යයන් සඳහා නොවන කාර්යයන් සඳහා යොදවන්නේ නම් | 04 0 |
| 03. | සෑම කරත්තයක් සඳහා ම | 20 0 |
| 04. | සෑම අත් කරත්තයක් සඳහා ම | 10 0 |
| 05. | සෑම රික්ෂෝවක් සඳහාම | 7 50 |
| 06. | සෑම අශ්වයකු, පෝනියකු හෝ කොටළුවකු සඳහා ම | 20 0 |
| 07. | සෑම ඇතෙකු හෝ අලියකු සඳහා ම | 50 0 |

විෂ්කම්භය 26 "නොඉක්මවන රෝද ඇති ළමා වාහන, වීල් බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළඳ කාර්යය සඳහා යොදවන අත්කරත්ත සහ වෙළඳ කාර්යය සඳහා නොයොදවන අත් කරත්ත මෙකී ගෙවීමෙන් නිදහස් කෙරේ.

මේ උපලේඛනයේ වෙළඳ කාර්යය යන්නට විකිණීම සඳහා හෝ අන්‍යාකාරයකින් හෝ යම් වෙළඳ ව්‍යාපාරයක් නැතහොත් කර්මාන්තයක් සඳහා වූ යම් ද්‍රව්‍ය හෝ බඩු යම් ලිඛිත නැතහොත් මුද්‍රිත ද්‍රව්‍ය ගෙන යාම හෝ ප්‍රවාහනය කිරීම ඇතුළත් වේ.

05-325/1

---

## ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාව

2011 වර්ෂයට බලපත්‍ර ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 147 වැනි වගන්තිය යටතේ ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර ව 2010 දෙසැම්බර් මස 23 වැනි දින පවත්වන ලද ප්‍රාදේශීය සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ආර්. එම්. රත්නායක,
සභාපති,
ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාව.

2010 දෙසැම්බර් මස 24 වැනි දින,
ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ හෝ ඒ පනතේ විධිවිධාන යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙහි උපලේඛනයේ 01 වැනි තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් ප්‍රාදේශීය සභාව විසින් 2011 වර්ෂයේ දී නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් මෙම උපලේඛනයේ 2 වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් 2011 වර්ෂය සඳහා පනවා අය කළ යුතු යැයි ද එකී බලපත්‍ර ගාස්තු 2011 මාර්තු 31 වැනි දිනට ප්‍රථම මෙම සභාවට ගෙවිය යුතු බවත් මෙයින් යෝජනා කරමි.

## උපලේඛනය

| I වැනි තීරුව | | II වැනි තීරුව | | | |
|---|---|---|---|---|---|
| අනු. අංකය | බලපත්‍රයෙන් බලය දෙනු ලබන කාර්යය | වාර්ෂික ආදායම රු. 750ට වැඩි | වාර්ෂික ආදායම රු. 750- රු. 1,000 දක්වා | වාර්ෂික ආදායම රු. 1,000- රු.5,000 දක්වා | වාර්ෂික ආදායම රු. 5,000ට වැඩි |
| | | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| 1 | සිල්ලර වෙළඳාම් කිරීමේ වෙළඳසලක් පවත්වාගෙන යාම | 200 0 | 350 0 | 750 0 | 1,000 0 |
| 2 | තොග වශයෙන් භාණ්ඩ ගබඩා කර තබාගෙන විකිණීම | 300 0 | 500 0 | 1,000 0 | 1,500 0 |
| 3 | බේකරියක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 750 0 | 1,000 0 |
| 4 | තේ කඩයක් හෝ කෝපි කඩයක් පවත්වාගෙන යාම | 200 0 | 300 0 | 500 0 | 700 0 |
| 5 | ලී වෙළඳසලක් පවත්වාගෙන යාම | 750 0 | 1,000 0 | 1,500 0 | 200 0 |
| 6 | හෝටලයක් හෝ භෝජනාගාරයක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 750 0 | 1,000 0 |
| 7 | පළතුරු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 200 0 | 400 0 | 400 0 | 500 0 |
| 8 | මුද්‍රණාලයක් පවත්වාගෙන යාම | 500 0 | 500 0 | 750 0 | 1,000 0 |
| 9 | සංචාරක වෙළඳාම් කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 200 0 | 250 0 | 300 0 | 500 0 |
| 10 | මිරිස්, කෝපි, පිටි, ධාන්‍ය, කුළුබඩු වර්ග ඇඹරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 350 0 | 450 0 | 550 0 | 750 0 |
| 11 | කළුගල් පිපිරවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 500 0 | 750 0 | 1,000 0 |
| 12 | බැටරි නැවත ආරෝපණය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 150 0 | 250 0 | 350 0 | 500 0 |
| 13 | එළවළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 200 0 | 300 0 | 350 0 | 500 0 |
| 14 | බයිසිකල් අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 150 0 | 250 0 | 350 0 | 450 0 |
| 15 | මෝටර් රථ හා වෙනත් වාහන අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 750 0 | |
| 16 | බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම | 200 0 | 300 0 | 500 0 | 750 0 |
| 17 | ලොන්ඩරියක් පවත්වාගෙන යාම | 200 0 | 300 0 | 350 0 | 400 0 |
| 18 | රෙස්ටුරන්ට් ශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 1,000 0 | 1,500 0 | 2,000 0 |
| 19 | සිසිල් බීම නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 | 1,000 0 |
| 20 | ග්‍රෝස් එකකට වඩා වැඩි සිසිල් බීම ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 400 0 | 500 0 | 500 0 |
| 21 | ගැලුම් 50ක තෙල් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 200 0 | 300 0 | 500 0 | 750 0 |
| 22 | යන්ත්‍රානුසාරයෙන් ලී ඉරුම්හලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 | 1,500 0 |
| 23 | සාමාන්‍ය කම්හලක් පවත්වාගෙන යාම | 200 0 | 250 0 | 300 0 | 500 0 |
| 24 | කෘත්‍රිම පොහොර ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 200 0 | 300 0 | 500 0 | 750 0 |
| 25 | පිත්තල භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 400 0 | 500 0 | 600 0 |
| 26 | කාර් ෂීට් කුෂන් කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 250 0 | 350 0 | 450 0 | 550 0 |
| 27 | යකඩ බඩු කඩයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 | 1,250 0 |
| 28 | යන්ත්‍රානුසාරයෙන් ක්‍රියා කරන ගල් මෝලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 | 1,500 0 |
| 29 | ටේලර් සාප්පුවක් පවත්වාගෙන යාම (මහන මැෂින් 03) | 200 0 | 300 0 | 500 0 | 750 0 |
| 30 | ටේලර් සාප්පුවක් පවත්වාගෙන යාම (මහන මැෂින් 05) | 300 0 | 500 0 | 750 0 | 1,000 0 |
| 31 | වෙල්ඩින් වැඩ පලක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 750 0 | 1,000 0 |
| 32 | ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 | 1,500 0 |
| 33 | අශ්වබල 20 දක්වා වී මෝලක් පවත්වාගෙන යාම | 300 0 | 400 0 | 500 0 | 750 0 |
| 34 | අශ්වබල 20ට වැඩි වී මෝලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 | 1,500 0 |
| 35 | අවමංගල්‍ය සේවා ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 400 0 | 500 0 | 750 0 |
| 36 | කුළු බඩු පමණක් පැකට් කර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 700 0 | 1,000 0 |
| 37 | පෞද්ගලික ආරෝග්‍ය ශාලාවක් පවත්වාගෙන යාම | 750 0 | 1,000 0 | 1,000 0 | 1,000 0 |
| 38 | පාවහන් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 200 0 | 300 0 | 400 0 | 500 0 |
| 39 | ගෘහ භාණ්ඩ වෙළඳසලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 | 1,500 0 |
| 40 | රෙකෝඩ් බාර් හෝ වීඩියෝ සෙන්ටර් පවත්වාගෙන යාම | 200 0 | 250 0 | 350 0 | 500 0 |
| 41 | අලුත් හෝ පාවිච්චි කළ ටයර් ගබඩා කිරීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 | 1,500 0 |
| 42 | ගුවන් විදුලි යන්ත්‍ර අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 250 0 | 300 0 | 400 0 | 500 0 |
| 43 | තීන්ත හෝ සායම් වර්ග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 400 0 | 500 0 | 600 0 |
| 44 | පින්තූර රාමු කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 200 0 | 300 0 | 400 0 | 500 0 |
| 45 | රථ වාහන අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 950 0 | 1,200 0 |
| 46 | මෝටර් රථ සේවා ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 | 1,500 0 |
| 47 | පෙට්‍රල්, ඩීසල්, වෙනත් ඛණිජ තෙල් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 1,000 0 | 1,500 0 | 2,000 0 |

| | I වැනි තීරුව | II වැනි තීරුව | | | |
|---|---|---|---|---|---|
| අනු. අංකය | බලපත්‍රයෙන් බලය දෙනු ලබන කාර්යය | වාර්ෂික ආදායම රු. 750 ට වැඩි | වාර්ෂික ආදායම රු. 750- රු. 1,000 දක්වා | වාර්ෂික ආදායම රු. 1,000- රු.5,000 දක්වා | වාර්ෂික ආදායම රු. 5,000ට වැඩි |
| | | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| 48 | හතු වගා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 700 0 | 1,000 0 |
| 49 | මනාලියන් හැඩගැන්වීමේ හෝ කොණ්ඩා මෝස්තර දැමීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 200 0 | 300 0 | 400 0 | 500 0 |
| 50 | මෝටර් සයිකල් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 | 1,500 0 | 2,000 0 | 2,500 0 |
| 51 | මැටි භාණ්ඩ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 200 0 | 300 0 | 400 0 | 500 0 |
| 52 | බුලත්- පුවක් වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 200 0 | 300 0 | 400 0 | 500 0 |
| 53 | දුරකථන සේවා ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 950 0 | 1500 0 |
| 54 | සාප්පු බඩු ඇතුළු සුබෝපභෝගී විදුලි භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 1,000 0 | 1,500 0 | 2,000 0 |
| 55 | රෙදි සාප්පුවක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 750 0 | 1,000 0 |
| 56 | පොත් සාප්පුවක් පවත්වාගෙන යාම | 300 0 | 400 0 | 500 0 | 600 0 |
| 57 | වීඩියෝ පට කුලියට දෙන ස්ථානයක් සඳහා | 200 0 | 300 0 | 400 0 | 500 0 |
| 58 | ඇලුමිනියම් හා ප්ලාස්ටික් බඩු විකිණීම සඳහා | 300 0 | 500 0 | 750 0 | 1,000 0 |
| 59 | මුදල් පොළියට දීමේ හෝ උකස් බඩු ගන්නා ස්ථානයක් සඳහා | 500 0 | 750 0 | 1,000 0 | 1,500 0 |
| 60 | මහන මැෂින්, රූපවාහිනී යන්ත්‍ර, ගුවන් විදුලි යන්ත්‍ර, ශීතකරණ විකිණීමේ ස්ථානයක් සඳහා | 750 0 | 1,000 0 | 1,500 0 | 2,000 0 |
| 61 | කෘෂි රසායනික ද්‍රව්‍ය විකිණීම | 500 0 | 750 0 | 1,000 0 | 1,500 0 |
| 62 | ධාන්‍ය වර්ග ගබඩා කිරීමේ ස්ථානයක් | 500 0 | 1,000 0 | 1,500 0 | 2,000 0 |
| 63 | සිනමා ශාලා පවත්වාගෙන යාම වෙනුවෙන් | 1,000 0 | 1,000 0 | 1,500 0 | 2,000 0 |
| 64 | රෝද දෙකේ හා රෝද ට්‍රැක්ටර් ගබඩා කර විකිණීමේ ස්ථානයක් සඳහා | 1,500 0 | 2,000 0 | 2,500 0 | 3,000 0 |
| 65 | යතුරුපැදි ගබඩා කර විකිණීමේ ස්ථානයක් සඳහා | 1,500 0 | 1,500 0 | 2,000 0 | 2,000 0 |
| 66 | ලොතරැයි නියෝජිත ආයතනයක් හෝ ලොතරැයි කුටි සඳහා | 300 0 | 400 0 | 500 0 | 600 0 |
| 67 | ඉංග්‍රීසි, සිංහල බෙහෙත් වර්ග විකිණීම සඳහා | 1,000 0 | 1,500 0 | 1,500 0 | 2,000 0 |
| 68 | රට බීම හෝ වෙනත් මත්පැන් බීම හලක් පවත්වාගෙන යාම | 1,500 0 | 2,000 0 | 2,500 0 | 3,000 0 |
| 69 | කොන්ක්‍රීට් වැඩ පලක් (ග්‍රිල් මල් පෝච්චි) | 500 0 | 1,000 0 | 1,500 0 | 2,000 0 |
| 70 | වැලි ගොඩ දැමීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 200 0 | 300 0 | 400 0 | 500 0 |
| 71 | සිමෙන්ති හා අළුහුණු විකිණීමේ ස්ථානයක් සඳහා | 500 0 | 750 0 | 1,000 0 | 1,500 0 |
| 72 | බැංකු මූල්‍ය ආයතනයක් හෝ රක්ෂණ සමාගම් සඳහා | 1,000 0 | 2,000 0 | 2,500 0 | 3,000 0 |
| 73 | ගරාජයක් සඳහා | 500 0 | 750 0 | 1,000 0 | 1,500 0 |
| 74 | උළු ගබඩා කර විකිණීමේ ස්ථානයක් සඳහා | 1,000 0 | 1,500 0 | 2,000 0 | 2,000 0 |
| 75 | සමාජ ශාලාවක් පවත්වාගෙන යාම | 1,000 0 | 1,500 0 | 2,000 0 | 2,500 0 |
| 76 | නොතාරිස් කන්තෝරුවක් පවත්වාගෙන යාම | 1,000 0 | 1,000 0 | 1,000 0 | 1,000 0 |
| 77 | පරිගණක පුහුණු මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 750 0 | 850 0 | 950 0 | 1,250 0 |
| 78 | ස්වර්ණාභරණ විකිණීමේ ස්ථානයක් සඳහා | 1,000 0 | 1,500 0 | 2,000 0 | 2,500 0 |
| 79 | වඩු මඩුවක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 750 0 | 1,000 0 |
| 80 | සූර්ය ශක්තිය භාවිතයෙන් විදුලිය ලබා දීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 750 0 | 1,000 0 | 2,000 0 | 2,500 0 |
| 81 | විදේශ රැකියා ඒජන්සියක් පවත්වාගෙන යාම | 750 0 | 1,000 0 | 1,500 0 | 2,000 0 |
| 82 | ලැමිනේටින් හා ෆොටෝ කොපි කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 350 0 | 500 0 | 750 0 | 1,000 0 |
| 83 | අයිස්ක්‍රීම් නිපදවන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 750 0 | 1,000 0 |
| 84 | මෝටර් රථ, පාපැදි, යතුරුපැදි අමතර කොටස් විකිණීම | 550 0 | 750 0 | 900 0 | 1,000 0 |
| 85 | ඛණිජ තෙල් විකිණීම | 500 0 | 1,000 0 | 1,500 0 | 2,000 0 |
| 86 | ඇස් කණ්නාඩි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 350 0 | 550 0 | 750 0 | 1,000 0 |
| 87 | සංචාරක මාළු වෙළඳාම | 300 0 | 400 0 | 500 0 | 600 0 |
| 88 | රූපවාහිනී ඇන්ටනා නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 400 0 | 500 0 | 600 0 |
| 89 | කිරි එකතු කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 | 1,200 0 |
| 90 | නිමි ඇඳුම් විකිණීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 200 0 | 300 0 | 400 0 | 500 0 |
| 91 | වී, මිරිස් මෝලක් පවත්වාගෙන යාම | 350 0 | 500 0 | 750 0 | 1,000 0 |
| 92 | ගෑස් වෙළඳාම වෙනුවෙන් | 300 0 | 400 0 | 500 0 | 600 0 |
| 93 | රන් රිදී ඔප දැමීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 200 0 | 300 0 | 500 0 | 600 0 |
| 94 | නූඩ්ල්ස් හෝ පපඩම් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 200 0 | 300 0 | 500 0 | 500 0 |
| 95 | රෙදි මුද්‍රණය කිරීම හෝ සායම් දැමීම සඳහා | 450 0 | 550 0 | 650 0 | 650 0 |

| I වැනි තීරුව | | II වැනි තීරුව | | | |
|---|---|---|---|---|---|
| අනු. අංකය | බලපත්‍රයෙන් බලය දෙනු ලබන කාර්යය | වාර්ෂික ආදායම රු. 750 ට වැඩි | වාර්ෂික ආදායම රු. 750- 1,000 දක්වා | වාර්ෂික ආදායම රු. 1000 5000 දක්වා | වාර්ෂික ආදායම රු. 5000ට වැඩි |
| | | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| 96 | ශීත කළ මාළු හෝ කුකුල් මස් විකිණීම සඳහා | 300 0 | 500 0 | 750 0 | 1,000 0 |
| 97 | ඌරු මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 750 0 | 1,000 0 | 1,500 0 |
| 98 | යෝගට් හා අනෙකුත් ශීතකළ ද්‍රව්‍ය නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 700 0 | 1,000 0 |
| 99 | රස කැවිලි නිපදවා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 700 0 | 1,000 0 |
| 100 | නිවාස සැලසුම් ශිල්පය හා උද්‍යාන අලංකරණය | 500 0 | 700 0 | 1,000 0 | 1,500 0 |
| 101 | ළදරු පාසැල් හැර පුද්ගලික පාසල් පැවැත්වීම | 300 0 | 500 0 | 750 0 | 1,000 0 |
| 102 | කුකුළු ගොවිපල (100ට වැඩි) | 300 0 | 500 0 | 700 0 | 1,000 0 |
| 103 | සිංහල බෙහෙත් අලෙවි කිරීමේ මධ්‍යස්ථාන | 300 0 | 500 0 | 750 0 | 1,000 0 |
| 104 | ඌරු ගොවිපල (04ට වැඩි) | 300 0 | 500 0 | 700 0 | 1,000 0 |
| 105 | විදුලි උපකරණ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 700 0 | 1,000 0 |
| 106 | සුරතල් මසුන් අලෙවි කිරීමේ හා පැල තවාන් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 750 0 | 1,000 0 |

මෙම බලපත්‍ර ගාස්තු 2011 මාර්තු මස 31 වැනි දිනට ප්‍රථම මෙම සභාවට ගෙවිය යුතු බවත් මෙයින් පසු ලබාගන්නා බලපත්‍ර සඳහා 10% ක දඩ මුදලක් අයකරන බව ද දැනුම් දෙමි.

05-325/7

---

### ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාව

ජල බද්ද පැනවීම - 2011 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 148 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 147 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර, 2010 වර්ෂයේ දෙසැම්බර් මස 23 වැනි දින පවත්වන ලද ප්‍රාදේශීය සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ආර්. එම්. රත්නායක,
සභාපති,
ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාව.

2010 දෙසැම්බර් මස 24 වැනි දින,
ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

*යෝජනාව* :-

**වාහන හා සත්ත්ව බද්ද**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 148 වැනි වගන්තිය සමග කියවිය යුතු ඒ පනතේ 147 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර සාමාන්‍යයෙන් ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුල ඇති හෝ පාවිච්චි කරනු ලබන්නා වූ සෑම වාහනයක් සහ සතෙක් වෙනුවෙන් ම මෙහි උපලේඛනයේ සඳහන් අනුප්‍රමාණ අනුව වූ වාර්ෂික බද්දක් 2011 වර්ෂයේ දී පනවා අය කළ යුතු යැයි යෝජනා කරමි.

***උපලේඛනය***

| | | රු. ශ. |
|---|---|---|
| 01. | මෝටර් රථයක්, මෝටර් ට්‍රයි කාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා | 25 0 |
| 02. | සෑම බයිසිකලයක් ට්‍රයිකාරයක් හෝ සෑම කරත්තයක් සඳහා | 18 0 |
| | *(අ)* වෙළඳ කාර්යයන් සඳහා යොදවන්නේ නම් | 04 0 |
| | *(ආ)* වෙළඳ කාර්යයන් සඳහා නොවන කාර්යයන් සඳහා යොදවන්නේ නම් | |
| 03. | සෑම කරත්තයක් සඳහා ම | 20 0 |
| 04. | සෑම කරත්තයක් සඳහා ම | 10 0 |
| 05. | සෑම රික්ෂෝවක් සඳහා ම | 50 0 |
| 06. | සෑම අශ්වයකු, පෝනියකු හෝ කොටළුවකු සඳහා | 20 0 |
| 07. | සෑම ඇතෙකු හෝ අලියකු සඳහා ම | 50 0 |

විෂ්කම්භය 26" නොඉක්මවන රෝද ඇති ළමා වාහන, වීල් බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළඳ කාර්යය සඳහා යොදවන අත්කරත්ත සහ වෙළඳ කාර්යය සඳහා නොයොදවන අත් කරත්ත මෙකී ගෙවීමෙන් නිදහස් කෙරේ.

මේ උපලේඛනයේ වෙළඳ කාර්යය යන්නට විකිණීම සඳහා හෝ අන්‍යාකාරයකින් හෝ යම් වෙළඳ ව්‍යාපාරයක් නැතහොත් කර්මාන්තයක් සඳහා වූ යම් ද්‍රව්‍ය හෝ බඩු යම් ලිඛිත නැතහොත් මූලික ද්‍රව්‍ය ගෙන යාම හෝ ප්‍රවාහනය කිරීම ඇතුලත් වේ.

05-325/9

**ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාව**

කර්මාන්ත බද්ද 2011 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තිය යටතේ ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2010 දෙසැම්බර් මස 23 වැනි දින පවත්වන ලද ප්‍රාදේශීය සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ආර්. එම්. රත්නායක,
සභාපති,
ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාව.

2010 දෙසැම්බර් මස 24 වැනි දින,
ගලෙන්බිඳුනුවැව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව :**

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුලත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන උපලේඛනයේ 01 වන තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් මෙම උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණය අනුව බද්දක් 2011 වර්ෂය සඳහා පනවා අයකළ යුතු යැයි ද, එකී බලපත්‍ර ගාස්තු 2011 මාර්තු 31 වැනි දිනට ප්‍රථම මෙම සභාවට ගෙවිය යුතු බවත් මෙයින් යෝජනා කරමි.

උපලේඛනය

| *I වැනි තීරුව* | | *II වැනි තීරුව* | | |
|---|---|---|---|---|
| | *කර්මාන්තයේ ස්වභාවය* | *පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම* | | |
| *අනු. අංකය* | | *රු. 750 නොඉක්මවන අවස්ථාවක* | *රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක* | *රු. 1,500 ඉක්මවන අවස්ථාවක* |
| | | *රු. ශ.* | *රු. ශ.* | *රු. ශ.* |
| 1 | වී මෝල් | 500 0 | 700 0 | 1,000 0 |
| 2 | ගඩොල් කපන ස්ථානයක් | 500 0 | 700 0 | 1,000 0 |
| 3 | වෑල්ඩින් වැඩපොලක් | 500 0 | 700 0 | 1,000 0 |
| 4 | යාන්ත්‍රික වඩු මඩු | 300 0 | 700 0 | 1,000 0 |
| 5 | කළුගල් කඩන ස්ථානයක් | 500 0 | 700 0 | 1,000 0 |
| 6 | ඇඹරුම්හල | 500 0 | 700 0 | 1,000 0 |
| 7 | රන් රිදී භාණ්ඩ නිෂ්පාදනය | 500 0 | 700 0 | 1,000 0 |
| 8 | ලී මෝල් | 500 0 | 700 0 | 1,000 0 |
| 9 | ගෘහ භාණ්ඩ අලෙවි සල් | 500 0 | 700 0 | 1,000 0 |
| 10 | යකඩ කම්හල් | 300 0 | 700 0 | 1,000 0 |

මෙම බලපත්‍ර ගාස්තු 2011 මාර්තු 31 වැනි දිනට ප්‍රථම මෙම සභාවට ගෙවිය යුතු බවත් මෙයින් පසු ලබාගන්නා බලපත්‍ර සඳහා 10%ක දඩ මුදලක් අයකරන බව ද දැනුම් දෙමි.

05-325/6

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.